# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1983 අංක 2 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1983 ජනවාරි මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 ජනවාරි මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් **පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

**මිළ :** ශත 20 යි

නැපැල් ගාස්තුව : ශත 50 යි

# 1983 අංක 2 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කලේ 1983 ජනවාරි මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 11/82

## 1979 අංක 52 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1983 අංක 2 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 52 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය පනතේ 2 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — 1979 අංක 52 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(3) (අ) මේ නීති සංග්‍රහයේ විධිවිධාන යටතේ කාර්මික සැලසුම්, පේටන්ට් බලපත්‍ර සහ වෙළෙඳ ලකුණු ලියාපදිංචි කිරීම පිළිබඳ සහ මේ නීති සංග්‍රහයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිණිස පත් කරනු ලබන හෝ ඒවා ක්‍රියාත්මක කිරීමෙහි ලා නිරත වන සියලුම තැනැත්තන් පිළිබඳ සාමාන්‍ය පාලනය සහ අධීක්ෂණය අමාත්‍යවරයාගේ විධානවලට යටත්ව, රෙජිස්ට්‍රාර්වරයා වෙත පැවරිය යුතු ය ; තවද

(ආ) ප්‍රදර්ශන, තරඟ, සම්මන්ත්‍රණ සහ පළ කිරීම් සංවිධානය කිරීමෙන් සහ ප්‍රකාශන අයිතිය ආරක්ෂා කිරීම සඳහා සංගම් පිහිටුවීමෙන්, ප්‍රකාශන අයිතිය පිළිබඳ විෂයය ගැන ජාතික වශයෙන් අවබෝධයක් ඇති කිරීම සහ ජාතික වශයෙන් අවබෝධයක් ඇති කිරීමට දිරිගැන්වීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම රෙජිස්ට්‍රාර්වරයා විසින් කළ යුතු ය.".

3. මේ පනතේ 2 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනය, ප්‍රධාන ප්‍රඥප්තිය ක්‍රියාත්මක වූ දිනයේ සිට, සියලු කාර්ය සඳහා ක්‍රියාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු ය. — සංශෝධනය අතීතයට ද බල පෑ යුතු බව.

ඒ 66524—11,725 (82/11)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.